## සමාලෝචනය

20 වන සියවස ආරම්භ වන විට ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූ වාණිජ බෝග වගාව නිසා මෙරට සමාජීය ආර්ථික හා දේශපාලන ක්‍රියාකාරීත්වයේ ප්‍රබල වෙනස්වීමක් පැහැදිලිව විද්‍යාමාන වූයේය. ලාංකිකයන්ට ආවේනිකව පැවති ස්වයං පෝෂිත සංතෘප්ත කෘෂි ආර්ථිකයකින්, වාණිජ බෝග වගාව හා සම්බන්ධ වූ වෙළඳ ආර්ථිකයක් බිහිවීමට මං පෙත් හෙළි කළේ 1658 සිට මුහුදු බඩ පළාත්වල ක්‍රියාත්මක වූ ඕලන්ද පාලන ක්‍රමයයි. එම කාලය තුළ, එකල වාණිජ ලෝකයේ වැඩි ඉල්ලුමක් පැවති වාණිජ බෝග රාශියක් ඔවුන් හඳුන්වා දුන්නද, ලාංකිකයා ඒ පිළිබඳව උනන්දුවක් නොදැක්වූයේ, ඕලන්දයන් අනුගමනය කළ ඒකාධිකාරී ආර්ථික පිළිවෙත නිසාය. කෙසේ වතුදු ඔවුන්ගේ ක්‍රියා කටයුතු නිසා වාණිජ බෝග වගා කිරීමත්, ඒවා අපනයනයට සූදානම් කිරීමත් පිළිබඳ දැනුමක් ලාංකිකයන්ට ලැබිණ. 1798 දී ලංකාවේ මුහුදුබඩ පළාත් බ්‍රිතාන්‍යයන් සතුවීමත්, ඔවුන් ඕලන්දයන් ක්‍රියාත්මක කළ ඒකාධිකාරී වාණිජ ප්‍රතිපත්ති ලිහිල් කිරීමත් වාණිජ බෝග ව්‍යාප්තිය කෙරෙහි ආරම්භක ආණ්ඩුකාරවරුන් ගෙන ගිය සංවර්ධනාත්මක වැඩ පිළිවෙල නිසාත් 1833 න් පසු මෙරට ක්‍රියාත්මක කළ රාජ්‍ය නිර්බාධවාදී ආර්ථික හා පරිපාලන ප්‍රතිපත්ති නිසා කෝපි ප්‍රධාන කොට පැවති වාණිජ බෝග වගාව නව පනක් ලැබුවේය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ 20 වන සියවස ආරම්භ වන විට ශ්‍රී ලංකාවේ තෙත් කළාපය වාණිජ බෝග වගාවෙන් පිරුණු නවීකරණයට හා නාගරීකරණයට පත් වූ හා බටහිර අධ්‍යාපනය නිසා බිහි වූ උගත් පන්තියක් ඇතිවීම හා ඔවුන් ස්වයං පාලනය සඳහා උද්ඝෝෂණය කිරීමත් යුරෝපීයන් එතෙක් මූලිකත්වය ගෙන ක්‍රියා කළ වාණිජ බෝග වගාවේ ප්‍රබල කොටස්කරුවන් වීමත්ය. මෙම වෙනස්කම්වල ආරම්භය සනිටුහන් කළේ බටහිර ජාතීන් අතට පත්වී තිබූ කොළඹ හා ගාල්ල කොමාන්ඩරිවලට අයත් ප්‍රදේශවලය. වර්තමාන පර්යේෂණය ඕලන්දයන් විසින් වාණිජ බෝග බොහෝමයක් හඳුන්වා දුන් දකුණු පළාත ආශ්‍රිතව 1935 සිට 1948 දක්වා කාලය තුළ ඇති වූ වාණිජ බෝග වගාවේ ව්‍යාප්තිය හා සංවර්ධනය සම්බන්ධව සළකා බැලීමය.

පර්යේෂණ කාල පරිච්ඡේදය ආරම්භ වන විට දකුණු පළාත තේ, රබර්, කුරුඳු, පොල් හා පැඟිරි ප්‍රධාන කොට වූ වාණිජ බෝග වගාවෙන් ද ලාංකිකයාගේ ප්‍රධාන ආහාරය සැපයූ වී ගොවිතැන හා ගෙවතු වගාවෙන් ද යුක්ත විය. 19 වන සියවසේ වාණිජ බෝග අතරින් කෝපි ප්‍රමුඛත්වය ලැබීම නිසා වාණිජ බෝග වගාවේ මුල් තැන ගත් කන්ද උඩරට ප්‍රදේශ කෝපි වතු වලින් පිරී ගියේ ආර්ථිකය එක් බෝගයක් මත යැපෙමිනි. 1870 ගණන්වල සිට සීඝ්‍රයෙන් පැතිරී ගිය (හැමීලියා වැස්ට්‍රාට්‍රික්) කොළ රෝගය නිසා දශකයට අඩු කාලයකින් කෝපි වගාව විනාශවී යාම නිසා ප්‍රබල ආර්ථික හා සමාජීය ගැටළු රාශියකට කන්ද උඩරට ප්‍රදේශය ගොදුරු වූයේය. කුරුඳු, පොල්, පැඟිරි, කෝපි වගාවන්ගෙන් යුත් ප්‍රමාණයෙන් විශාල වූ වාණිජ බෝග වගාවන්ගෙන් යුක්ත වූ පාරම්පරික කෘෂිකර්මය අත් නොහළ දකුණු පළාත්වාසීන්ට කෝපි පරිහානියේ දරුණු ප්‍රතිඵල වලට මුහුණ දීමට සිදු නොවිය.

කෝපි පරිහානියෙන් මිදීමට උඩරට ව්‍යවසායකයන්ට ආධාර වූ තේ වගාව 19 වන සියවස අවසානයේ දකුණු පළාතේ සීඝ්‍ර ව්‍යාප්තියක් පෙන්නුම් කළේ අළුතින් හඳුන්වා දුන් රබර් වගාවේ ද ක්ෂණික සංවර්ධනයක් පෙන්නුම් කරමිනි. වතු වගාවේ දියුණු විද්‍යාත්මක හා තාක්ෂණික අත්දැකීම් සහිතව කන්ද උඩරට වූ විදේශීය ව්‍යවසායකයන් ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක වල කැළෑ ඉඩම් මිලදී ගෙන විශාල තේ හා රබර් වතු ආරම්භ කළහ. මේ නිසා වැවිලි ආර්ථිකය දකුණු පළාතේ අභ්‍යන්තර කොටසේ ප්‍රබල තත්වයකට පත්වූ අතර ග්‍රාමීය ජනතාවගේ වැවිල්ලක් වූ පොල් වගාව ආශ්‍රිතව දියුණු වූ කර්මාන්ත රාශියක් නිසා මුහුදුබඩ ප්‍රදේශ සංවර්ධනාත්මක මාවතේ ඉදිරියට ගමන් කළේය. සමකාලීනව සංවර්ධනය වූ මිනිරන් පතල් කර්මාන්තය දකුණු පළාතේ ව්‍යවසායකයන්ට අතිරේක මූල්‍ය සම්පත් ළඟා කළේය.

මෙම පසුතලය යටතේ ඇති වූ ආණ්ඩුක්‍රම සංවර්ධනය නිසා 1931 සිට පාලනයේ වැඩි කොටසකට දායකවීමට උගත් ලාංකික පන්තියට අවස්ථාව හිමි විය. මේ නිසා ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිට වූ විධායක කාරක සභාවට පරිපාලන අධීක්ෂණය බාරවීමත් සමඟ ස්වදේශකයන්ගේ යහපත උදෙසා විවිධ නීති පැනවීම හා ඒවා ක්‍රියාවට නැගීමට අවශ්‍ය පරිපාලන සංවිධානය හඳුන්වා දෙන්නට විය. දකුණු පළාතේ වතු වගාවේ සීඝ්‍ර දියුණුවක් සනිටුහන් කළ 1935 සිට ක්‍රියාත්මක වූ ඉඩම් සංවර්ධන පනත මින් ප්‍රධාන තැනක් ගනී. යථෝක්ත පනත යටතේ මධ්‍යම පන්තිකයන් සඳහා අක්කර 50 දක්වා ඉඩම් කට්ටි ලබාගැනීමට ඇති කළ පහසුකම් අප පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන මාතෘකාවක් වුයේය. විවිධ අංශවලින් මිල මුදල් උපයාගත් ශ්‍රී ලාංකික ව්‍යවසායකයන්ට මේ නිසා වතු වගාවට ලගින් දායක විය හැකි විය. මෙහිලා රබර් වගාව ප්‍රධාන තැනක් ගත් අතර තේ වගාව ද ඒ ප්‍රමාණයෙන්ම දියුණු වූයේය. ඒ අතර දෙවන ලෝක සංග්‍රාමය නිසා උදා වූ තත්ත්වය නිසා යුරෝපීයන් 1940 ගණන් වල සිට තම ව්‍යාපාර විකුණා දැමීම ආරම්භ වීමත් සමඟ යථෝක්ත මිල මුදල් උපයාගෙන සිටි දේශීය ව්‍යාපාරිකයෝ ඒවා මිල දී ගැනීමට ඉදිරිපත් වූහ. මොවුන් අතර වාණිජ බෝග වගාවන් පිළිබඳ උසස් අධ්‍යාපනික දැනුම ලැබූ පිරිසක් ද විය. දේශීය වැවිලිකරුවන්ට මොවුන්ගෙන් මහඟු සේවාවක් ඉටු විය. මේ නිසා අප පර්යේෂණයට ලක් වූ කාලය අවසාන වන විට දේශීය ව්‍යවසායකයන් පිරිසකට දකුණු පළාතේ වාණිජ බෝග නිෂ්පාදනය පත් වී තිබිණ.